**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - 2 කොටස - 2021**

-----------------------------------------------------------------

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - 2 කොටසේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සළකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම අනුව, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

මේ වන විට ක්‍රියාත්මක වන දක්ෂිණ අධිවේගී මාර්ගය (කොළඹ සිට මාතර දක්වා) මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කරමින් යෝජිත හම්බන්තොට ජාත්‍යන්තර සංවර්ධන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය, වාණිජ අගනගරය, හම්බන්තොට ජාත්‍යන්තර වරාය සහ ගුවන්තොටුපල (මත්තල) අතර සම්බන්ධයක් ඇති කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ 02 වන කොටස යටතේ දක්ෂිණ අධිවේගී මාර්ගය බෙලිඅත්ත සිට වැටිය දක්වා කිලෝමීටර් 26 ක් දීර්ඝ කිරීම සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 60,601.60 ක් වූ අතර, ඉන් සියයට 85 ක් වූ එජඩො මිලියන 360.29 කට සමාන වූ රු.මිලියන 46,920 ක් සිවිල් හා උපදේශන කටයුතු සඳහා චීන අපනයන ආනයන බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. එජඩො මිලියන 63.58 ක් වූ ඉතිරි සියයට 15 මූල්‍යනය සඳහා ශ්‍රී ලංකා රජය විසින් එකඟ වී තිබුණි.

ව්‍යාපෘතියේ කටයුතු 2016 ඔක්තෝබර් 28 දින ආරම්භ කරන ලද අතර, 2019 ඔක්තෝබර් 27 දින වනවිට නිම කිරිමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපාතිය අවසන් කරන දිනය 2020 අප්‍රේල් 11 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2 ඡේදයේ දක්වා ඇති කරුණුවල බලපෑම හැර 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2 ඡේදයේ දක්වා ඇති කරුණු මත මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරන අඩුපාඩුව / විගණන නිරීක්ෂණය | මුදල රු.මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන අනුව, රු.මිලියන 58,874.64 ක් වටිනා ස්ථාවර වත්කම් මාර්ග සංවර්ධන අධිකාරිය (මා.ස.අ.) වෙත භාර දී තිබුණද, 2022 දෙසැම්බර් 31 දිනට මා.ස.අ. මූල්‍ය ප්‍රකාශනවල එය රු.මිලියන 51,854.35 ක් | 7,020.29 | අදහස් දක්වා නොතිබුණි. | ප්‍රමාදයකින් තොරව මා.ස.අ. ගිණුම්වල වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ලෙස දක්වා තිබුණි. එම නිසා, ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම 2023 මාර්තු 20 දින තෙක් ප්‍රමාද වීම හේතුවෙන්, 2022 දෙසැම්බර් 31 දිනට මා.ස.අ. වත්කම් රු.මිලියන 7,020.29 කින් අඩුවෙන් දක්වා තිබුණි. | | | |
| (ආ) | ණය ගිවිසුමෙහි 2.2 ව්‍යවස්ථාව අනුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ණය සඳහා ගෙවන ලද සමුච්ඡිත පොලිය සහ බැඳීම් ගාස්තු 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ගත කර නොතිබුණි. එම නිසා, මූල්‍ය ප්‍රකාශනවල විදේශ ණය ශේෂය සහ නොනිමි වැඩ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 3,204.42 | ණය සඳහා පොලිය සහ බැඳීම් ගාස්තු මහාභාණ්ඩාගාරය විසින් ඔවුන්ගේ වැය විෂය හරහා ගෙවනු ලබන අතර ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ගත කර තිබුණි. එම නිසා, එය මහාභාණ්ඩාගාරයේ පිරිවැයක් ලෙස සළකනු ලැබේ. පොලී වියදම් සහ බැඳීම් ගාස්තු සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සෘජුවම සම්බන්ධ නොවේ. | පොලී සහ බැඳීම් ගාස්තු ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 04 හි 18 වන වගන්තිය අනුව, වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය සඳහා සෘජුවම අදාල වන ණය ගැණුම් පිරිවැය එම වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කළ යුතුය. කෙසේ වුවද, 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 7,517.72 ක් වූ දේශීය බැංකු ණය වටිනාකමට අදාල ණය ගැණුම් පිරිවැය ව්‍යාපෘතිය විසින් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - | ව්‍යාපෘති පිරිවැය මූල්‍යනය සඳහා මා.ස.අ. විසින් වරින් වර දේශීය බැංකු වෙතින් කාලීන ණය ලබා ගෙන තිබුණි. කෙසේ වුවද, එම ණය සඳහා වූ පොලී වියදම එහි ප්‍රාථමික ණයකරු වන මා.ස.අ. විසින් වෙනම ගිණුම් ගත කර ඇත. ණය පහසුකම් හා සම්බන්ධ සියළුම මුදල් ප්‍රවාහ මා.ස.අ. පොත්වල සිදු කර ඇති අතර ව්‍යාපෘතියෙන් කිසිඳු සම්බන්ධ වීමක් නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |
| (ඈ) | රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ට පටහැනිව, ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වන්දි සහ ප්‍රමාද පොලී සඳහා ප්‍රතිපාදන සිදු කර නොතිබුණි. | - | ඉඩම් අත්පත් කර ගැනීම් සහ වන්දි ගෙවීම් මා.ස.අ. ඉඩම් අංශය විසින් සිදු කර ඇත. එබැවින්, ඉඩම් අත්පත් කර ගැනීමට සම්බන්ධ සියළු වගකීම් සහ පොලී ගෙවීම් මා.ස.අ. මූල්‍ය ප්‍රකාශනවල දැනටමත් ඇතුළත් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශන සටහන් අනුව, ආයතනික බදු (Corporate Tax) ලෙස මුදලක් අධීක්ෂණ උපදේශක විසින් ඉල්ලා තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ට අනුව එම වගකීම සඳහා ප්‍රතිපාදන සිදු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 33.12 | උපදේශකගේ ආයතනික බද්ද ශ්‍රී ලංකා රජය විසින් ගෙවීම උපදේශනය සඳහා වන ගිවිසුමේ විශේෂ කොන්දේසි 1.10 වගන්තියේ නියම කර තිබුණද, ව්‍යාපෘතිය විසින් මේ වන තෙක් හඳුනාගෙන තිබුණු වටිනාකම සමඟ ගෙවීම් නියෝජිතායතනය (මා.ස.අ.) එකඟ වී නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට පොලියක් ගෙවීමට ආරවුල් විනිශ්චය මණ්ඩලය (DAB) විසින් තීරණය කර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව ප්‍රතිපාදන සළසා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 31.67 | ආරවුල් විනිශ්චය මණ්ඩලය විසින් අනුමත කරන ලද මුදල අඩු කිරීමට කොන්ත්‍රාත්කරු විරෝධයක් මතුකර තිබුණි. තත්ත්වය සලකා බැලීමෙන් පසු, එකඟ නොවීම හේතුවෙන් ගෙවීම් අගය යථාර්ථවාදී ලෙස තක්සේරු කර නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |
| (උ) | 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3.23 ක ඉඩම් අත්පත් කර ගැනීම් මත රඳවාගැනීම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර එබැවින් එය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | 3.23 | අදහස් දක්වා නොතිබුණි. | තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරණ කළමණාකරන සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුල එය පවත්වා නොතිබුණි. | 2021 වර්ෂයේ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

**(i) ඉඩම් ලියාපදිංචි කිරීම**

| සංරචකය | කාර්යය | | 2021 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය | අත්කරගත් කාර්යසාධනය | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| | | | කැබලි | කැබලි | | |
| ඉඩම් අත්පත් කර ගැනීම | මා.ස.අ. හිමිකම පැවරීම | | | | 2020 පෙබරවාරි 24 දින ව්‍යාපෘතිය අවසන් කර තිබුණද, 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 වගන්තිය ප්‍රකාරව ඉඩම් කැබලි 32 ක් පමණක් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කර තිබුණු බව නිරීක්ෂණය විය. | ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලියේ අකාර්යක්ෂමතාවය. |
| | | රජයේ ඉඩම් | 914 | 32 (රජයේ ඉඩම් හා පුද්ගලික ඉඩම් සඳහා එකතුව) | | |
| | | පුද්ගලික ඉඩම් | 2,170 | | | |

**කළමනාකරණයේ අදහස් දැක්වීම** ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මෙම ව්‍යාපෘතියේ අත්පත් කර ගැනීමේ නිලධාරී ලෙස ක්‍රියා කරයි. ඒ අනුව, වන්දි ගෙවීමෙන් පසු 44 වගන්තියේ ක්‍රියාවලිය ද ඔවුන් විසින් සිදු කරයි.

**විගණකගේ නිර්දේශයන්** අමතර පිරිවැයකින් තොරව කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීමට උපරිම උත්සාහයන් ගත යුතුය.

**(ii) ඉඩම් අත්පත් කර ගැනීම**

| සංරචකය | ක්‍රියාකාරකම | 2021 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය කැබලි | ළඟා කරගෙන ඇති කාර්යසාධනය කැබලි | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| ඉඩම් අත්පත් කර ගැනීම | ඉඩම් අත්පත් කර ගැනීම | | | ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය 2014 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර සති 26 ක් ඇතුළත ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාපටිපාටි කඩිනම් කිරීමට හා අවසන් කිරීමටට රු.මිලියන 14.82 ක දිරිදීමනා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, තක්සේරු දෙපාර්තමේන්තුවේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ට ගෙවා තිබුණද, විගණිත දින වන විටත් එම ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පැවතුණි. | ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලියේ අකාර්යක්ෂමතා වය. |
| | රජයේ ඉඩම් | 914 | 2,884 | | |
| | පුද්ගලික ඉඩම් | 2,170 | | | |

| | |
|---|---|
| **කළමනාකරණයේ අදහස් දැක්වීම** | මේ වන විට, මෙම කොටසේ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රධාන වැඩකටයුතු දැනටමත් අවසන් කර ඇති අතර සමහර විශේෂ අතිරේක අත්පත් කර ගැනීම් ක්‍රියාත්මක වෙමින් පවතී. කෙසේ වුවද, නියමිත කාලසීමාවෙන් පරිබාහිරව සම්පූර්ණ කරන කිසිදු ක්‍රියාකාරකමක් සඳහා දිරිදීමනා ගෙවීම් අනුමත කර නොමැත. |
| **විගණකගේ නිර්දේශයන්** | කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ලභාකර ගැනීමට උපරිම උත්සාහයන් ගත යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ශක්‍යතා වාර්තාවේ 8.33 පරිච්ඡේදයේ සේවා ප්‍රදේශ ස්ථාන දෙකක් සඳහන් කර තිබුණද, එය ඇස්තමේන්තු කර නොතිබුණු අතර දක්ෂිණ අධිවේගී මාර්ගයේ සම්පූර්ණ දිගුව සඳහා සේවා ප්‍රදේශය ඉදිකිරීමට ප්‍රමාණ පත්‍රවල ප්‍රතිපාදන සපයා නොතිබුණි. එම නිසා, දක්ෂිණ අධිවේගී මාර්ගය භාවිතා කරන්නන් සඳහා කිලෝමීටර් 176 ක් වූ වැලිපැන්න සිට හම්බන්තොට දක්වා කිසිදු සේවා කලාපයක් නොතිබුණි. | එය සැලසුම්වලට ඇතුළත් කර නොතිබුණද, මාර්ග භාවිතා කරන්නන්ගේ පහසුව සඳහා දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව සඳහා දෙවන සේවා ප්‍රදේශයක් පිහිටුවීමේ වැදගත්කම පැහැදිලි කරමින් මා.ස.අ. සභාපතිවරයා විසින් චී.ස.දෙ. හරහා චීනයේ එක්සිම් බැංකුව සමඟ සාකච්ඡා කර තිබුණි. කෙසේ වුවද, චීනයේ එක්සිම් බැංකුව ඒ සඳහා අරමුදල් සැපයීම ප්‍රතික්ෂේප කරන ලදී. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කාලීනව ලභා කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| අයවැයෙන් සිදු කරන ලද රු.මිලියන 9,279.35 ක මුළු ප්‍රතිපාදනයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 9,018.42 ක මුදලක් උපයෝජනය කර තිබුණි. | පිළිගනිමි. | ව්‍යාපෘති කාල සීමාව තුළ අරමුදල් උපයෝජනය කිරීමට උපරිම උත්සාහයන් ගත යුතුය. |

## 3.4 ප්‍රධාන කාර්යසාධන දර්ශක සාක්ෂාත් කරගැනීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| බෙලිඅත්තේ සිට වැටිය දක්වා ආසන්න වශයෙන් කිලෝමීටර් 26 ක් වූ දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ 2 වන කොටස, මාතර සිට අන්දරවැව සහ හම්බන්තොට හරහා මත්තල දක්වා ප්‍රවේශ පාලනය අධිවේගී මාර්ගයේ දෙවැනි කොටස වේ. ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, පරිසර හිතකාමී අධිවේගී මාර්ගයක් සැපයීම, ගමන් කාලය අඩුකරමින් විදේශ ආයෝජකයන් දිරිමත් කිරීම, කඩිනම් සංවර්ධනය හේතුවෙන් අන්තර් භුවමාරු ප්‍රදේශවල නව රැකියා අවස්ථා ඇති කිරීම යනාදිය ව්‍යාපෘති අරමුණු ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වුවද, ප්‍රධාන කාර්ය සාධන දර්ශක සැකසීම සහ දර්ශක සාක්ෂාත් කර ගැනීම ඇගයීම පිළිබඳව විගණනයට අනාවරණය නොවුණි. | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාවේ ව්‍යාපෘති අරමුණු අඩංගු වේ. | කාර්යසාධන දර්ශක ස්ථාපනය කළ යුතු අතර ව්‍යාපෘතිය අවසානයේ ඇගයීම් සිදුකළ යුතුය. |